රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 32/89 (V)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 මාර්තු මස 16 වෙනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්රුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසාපතිවරුන්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථාවල සභාපතිවරුන්/ නිසි බලධාරීන්,
රජය සතු සමාගම්වල සභාපතිවරුන්/
නිසි බලධාරීන් වෙත.

**1980 ජූලි වැඩ වර්ජනයට සහභාගි වූ නිලධාරීන්ගෙන් යළි සේවයෙහි පිහිට වූ අයට 32/89 (IV) චක්‍රලේඛය අනුව සහන සැලසීම.**

1991 අප්‍රේල් මස 22 වැනි දින නිකුත් කරන ලද 32/89 (IV) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතරවයි.

02. එකී චක්‍රලේඛයේ තුන්වැනි (03) වගන්තියෙහි සඳහන් ජූලි වර්ජකයින්ට දිය යුතු උසස්වීම් පිළිබඳව පහත සඳහන් පැහැදිලි කිරීම් කරනු ලැබේ.

03. වැඩ වර්ජන කාලසීමාව තුළ සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටීමට නොහැකිවීමෙන් පාඩු සිදු වී ඇති අයට ඉදිරියේ දී පැවැත්වෙන විභාග දෙකකට පෙනී සිටීමට අවස්ථාව ලබාදෙනු ලැබේ. ඒවා සමත්වන අයට කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුව තිබූ දිනයේ දී විභාගය සමත් වූවා සේ සලකා කටයුතු කළ යුතුය.

04. වයස අවුරුදු 45 සම්පූර්ණ වීමෙන් හා නියමිත වැටුප් තලයට එළඹීමෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස්වීමට සුදුසුකම් තිබූ අයට එකී දින වැඩ වර්ජන කාලය ඇතුළත්වීම නිසා එසේ නිදහස්වීමට නොහැකි වී නම්, වයස අවුරුදු 45 වූ දිනය හෝ නියමිත වැටුප් තලයට පසුව එළඹෙන දිනයේ දී කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීම හෝ පවත්වන විභාගයට පෙනී සිට විභාගය සමත් වුවහොත් අතීතයේ දී සුදුසුකම් ලැබූ නියමිත දිනයට විභාගයට පෙනී සිට එය සමත් වූ සේ සලකා ක්‍රියා කළයුතු වේ.

05. කිසියම් විභාගයකට හා නියමිත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් වී පත්වීම් ද ලබාගෙන ජූලි වැඩ වර්ජනයට සහභාගිවීම නිසා එම පත්වීම අවලංගු කරන ලද්දේ නම්, එම අවලංගු කරන ලද දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුනට පත්වීම් ලබා දිය යුතුය. තව ද ඉහත කී සුදුසුකම් සම්පූර්ණ කරන ලද නමුත්, වැඩ වර්ජනයට සහභාගිවීමේ හේතුව නිසා, පත්වීම් නොලද අයට එම පත්වීම් දිය යුතුව තිබූ දිනයේ සිටම ක්‍රියාත්මක වන පරිදි පත්වීම් දිය යුතුය.

06. කුසලතා මත උසස්වීම් ලබා දීමේ දී ඒ අවස්ථාවේ දී අනෙකුත් කරුණු මත සුදුසුකම් සපුරා තිබූ නමුත්, වැඩ වර්ජනයට සහභාගිවීමේ හේතුව නිසාම, එම උසස්වීම් අහිමි වූ අයට එම උසස්වීම් ලැබිය යුතු දිනයේ සිටම පත්වීම් ලබා දිය යුතුය.

**07.** වැඩ වර්ජකයන්ට පනවා තිබූ කොන්දේසි නිසා, අනෙකුත් සුදුසුකම් ලබා සිටි නමුත්,

I. කිසියම් උසස්වීම් විභාගයකට පෙනී සිටීමට නොහැකි වූ,

II. විභාගයකට පෙනී සිට සමත් වූ නමුත්, නියමිත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු නොලැබූ,

III. විභාගයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ නමුත්, ලකුණු නොලැබූ හෝ අඩු ලකුණු ලැබුවා යයි සිතන අයට,

පැවැත්වෙන විභාග තුනකට (03) පෙනී සිටීමට ඉඩදෙන අතර, එයින් සමත්වන්නේ නම් වැඩ වර්ජනය නිසා විභාගයට පෙනී සිටීමට නොහැකි වූ ආසන්නතම විභාගයෙන් සමත් වූවා සේ සලකා පත්වීම් දිය යුතුය.

08. මෙම පත්වීම් දීමේ දී නියමිත දින සිට ජ්‍යෙෂ්ඨත්වය, හිඟ වැටුප්, නිලධාරියා ඉදිරි කාලසීමාව තුළ වැටුප් වර්ධක උපයාගෙන ඇත්නම්, ඒ අනුකූලව වැටුප් වර්ධක ද ලබා දිය යුතු වේ. උසස්වීම ලැබීමට නියමිත දිනට පසු නිලධාරියා කිසියම් දඬුවමකට යටත් වූයේ නම්, උසස්වීම් ලද පසුව, එම දඬුවමට යටත් වූවා සේ සලකා ක්‍රියා කළයුතු වේ.

අ.කලේ/ ( එම්.එන්.ජුනයිඩ් )
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.